# 2016

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය
பாராளுமன்றத்தின் எதிர்க்கட்சித் தலைவர் அலுவலகம்
***Office of the Leader of the Opposition of Parliament***

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

වැය ශීර්ෂය
தலைப்பு
**HEAD** } **19**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය
பாராளுமன்றத்தின் எதிர்க்கட்சித் தலைவரின் அலுவலகம்
OFFICE OF THE LEADER OF THE OPPOSITION OF PARLIAMENT

## පටුන


**1.** දැක්ම හා මෙහෙවර ........................................................................ 1

**2.** ප්‍රධාන කාර්යයන් ........................................................................ 3

**3.**විපක්ෂ නායක කාර්යාලයේ සංයුතිය ........................................................................ 6

**3.1** සංවිධාන ව්‍යුහය ........................................................................ 7

**4.** කාර්ය මණ්ඩල විස්තර ........................................................................ 8

**4.1** ස්ථිර කාර්ය මණ්ඩලය ........................................................................ 8

**4.2** පෞද්ගලික කාර්ය මණ්ඩලය ........................................................................ 9

**4.3** 2016 දී සිදු වූ කාර්ය මණ්ඩලය වෙනස්වීම් ........................................................................ 10

**4.3.1**ස්ථිර කාර්ය මණ්ඩලය ........................................................................ 10

**4.3.2**පෞද්ගලික කාර්ය මණ්ඩලය ........................................................................ 11

**5.** කාර්යය සාධනය ........................................................................ 12

**5.1** සාමාන්‍ය කාර්යය සාධනය ........................................................................ 12

**5.2** මූල්‍ය කාර්යය සාධනය ........................................................................ 16

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ........................................................................ 19

## දැක්ම

***ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ශක්තිමත් විපක්ෂයක් සඳහාවූ දායකත්වය***

## මෙහෙවර

***ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ගරු විපක්ෂ නායකතුමාට හා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රශස්ත සේවයක් සැලසීම.***

## 2. ප්‍රධාන කාර්යයන්

- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයට පැවරී ඇති සියළුම කාර්යයන් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම.
- සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියකම දෛනික වැඩසටහන, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කළ පසු ඒ පිළිබඳ විපක්‍ෂයේ ගරු මන්ත්‍රීවරුන් ලිපි, ෆැක්ස්,කෙටි පණිවුඩ,විද්‍යුත් තැපැල හා දුරකථනය මගින් දැනුවත් කිරීම.
- ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් පිළිබඳ විපක්ෂයේ ගරු පක්ෂ නායකයින් හා අදාළ අනෙකුත් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් සඳහා ගරු විපක්ෂ නායකතුමාගේ කාර්යාලය නියෝජනය කරමින් සහභාගී වීම.
- පාර්ලිමේන්තු රැස්වීම්වලදී විපක්‍ෂය වෙනුවෙන් සහභාගී වන කථිකයන්ගේ නාම ලේඛන සකස් කිරීම සහ කතා වෙනුවෙන් කාලය වෙන් කර දීම.
- ස්ථාවර නියෝග 23/2 යටතේ විපක්‍ෂයේ පක්ෂ නායකයින් විසින් ඉදිරිපත් කරන ප්‍රශ්න පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කිරීම.
- සභාව කල්තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න විවාදයට ගනු ලබන දිනයන් හෝ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කෙරෙන දිනයන් පිළිබඳ විපක්‍ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කර ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා හා ප්‍රශ්න පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කිරීම.
- ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු ලබා ගැනීම සඳහා විපක්‍ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ප්‍රශ්න පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කිරීම.
- පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම් සිදු කරන අවස්ථාවන්හිදී විපක්‍ෂයේ ගරු මන්ත්‍රීවරුන් කැඳවීමට අවශ්‍ය කටයුතු කිරීම හා ගරු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම පිළිබඳව අවශ්‍ය වාර්තා තබා ගැනීම.
- ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම යෝජනා පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කිරීම.
- පාර්ලිමේන්තු ආංශික අධික්ෂණ කාරක සභා රැස්වීම් කාල සටහන් පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් කෙටි පණිවුඩ හා විද්‍යුත් තැපැල මගින් දැනුවත් කිරීම.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය අවස්ථාවලදී තොරතුරු ලබා දීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සහා රැස්වීම් ආවරණය කිරීම.

- අන්තර් පාර්ලිමේන්තු සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, සාර්ක් පාර්ලිමේන්තු සංගමය සහ අනෙකුත් අදාළ විදේශ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නම් කර යැවීමට කටයුතු කිරීම.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු යෝජනා (මාස 03 ඉකුත්වීමට පෙර) සකස් කිරීම, අධීක්ෂණය හා ඒවා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම පිණිස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය පසුබිම් වාර්තා, තොරතුරු, හා අධිකරණ තීරණ යනාදී ලේඛන සැපයීම.

- තෙවනි වර අය වැය කියවීමේ විවාදය පිළිබඳ කාල සටහනෙහි කෙටුම්පත් සකස් කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු අය වැය කාරක සභා අවස්ථාවට අදාළ වැඩ සටහන භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එහි මුද්‍රිත පිටපත් බෙදා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ලිපි ලේඛන භාෂාත්‍රයට පරිවර්තනය කිරීම.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විදේශ ගතවීමේදී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර අනුමැතිය සඳහා ගරු විපක්ෂ නායකතුමා වෙත ඉදිරිපත් කිරිම.

- පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටතදී පවත්වනු ලබන විවිධ රැස්වීම් නියෝජනය කිරීමේදී ගරු විපක්ෂ නායකතුමාට අවශ්‍ය වන සහයෝගය ලබා දීමට කටයුතු කිරීම.

- පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ යාවත්කාලීන කළ සන්නිවේදන තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

- පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වන දිනයන්හි සම්පූර්ණ කාල සීමාව තුළදීම කාර්යාලයීය නිලධාරීන් පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් සඳහා වෙන් කර ඇති නිල මැදිරියේ රාජකාරි සඳහා යොදවා එමගින් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සහායන් ලබා දීමට කටයුතු කිරීම.

- එක් එක් රැස්වීම් සතිවල පාර්ලිමේන්තු වැඩසටහනට අදාළ සියළුම තොරතුරු (පනත්, කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි, පනත්වලට කරනු ලබන සංශෝධන යනාදිය) ඇතුළත් ලිපිගොනු සකස් කර ඒවා විපක්ෂයේ පක්ෂ නායකයින්ගේ විමර්ශනය සඳහා පෞද්ගලිකවම බාර දීම.

- ගරු විපක්ෂ නායකතුමා හමුවීමට පැමිණෙන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, විදේශීය දූත මණ්ඩල හා අනෙකුත් අමුත්තන් සම්බන්ධයෙන් පවත්වනු ලබන සාකච්ඡා සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

- දේශීය හා විදේශිය ආයතනවලින් සහ පුද්ගලයින්ගෙන් ගරු විපක්ෂ නායකතුමාට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු කිරීම.

- ගරු විපක්ෂ නායකතුමාගේ දේශීය හා විදේශීය සියලු නිල සංචාර සංවිධානය කිරීම.

- ගරු විපක්ෂ නායක තුමාට ලැබෙන මහජන පැමිණිලි හා දුක් ගැනවිලිවලට පිළියම් ලබා දීම සඳහා එතුමාගේ උපදෙස් පරිදි මැදිහත්වීම හා පසුවිපරම් කිරීම.

- ගරු විපක්ෂ නායක තුමාගේ උපදෙස් පරිදි මාධ්‍ය සාකච්ඡා කැඳවීමේ හා නිවේදන නිකුත් කිරීමේ කටයුතු සංවිධානය කිරීම.

- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ හා කොළඹ 07, මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 30 දරන ස්ථානයේ ඇති විපක්ෂ නායක කාර්යාලයේ සියළුම පරිපාලන හා මුල්‍ය කටයුතු සිදු කිරීම.


- ගරු විපක්ෂ නායක තුමාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කණ්ඩායම් රැස්වීම් කැඳවීම, හා එම රැස්වීම් වල සියළු වාර්තා තබා ගැනීම, ඒවා ගරු මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීම, හා පසු විපරම් කිරීම.

- විපක්ෂ නායක නිල නිවසෙහි අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය සහාය දීම.

- පාර්ලිමේන්තු මහ ලේකම්වරයාටත් ඔහුගේ කාර්යය මණ්ඩලයටත් සිය කටයුතු ඉටුකිරීමේදී මෙම කාර්යාලයෙන් අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කිරීම.


## 3.විපක්ෂ නායක කාර්යාලයේ සංයුතිය



## 3.1 සංවිධාන ව්‍යුහය

මෙම කාර්යාලයේ කටයුතු පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ උපදෙස් හා විධානයන් යටතේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ මැදිහත් වීම මත විපක්ෂ නායක ලේකම් විසින් මෙහෙය වනු ලැබේ.



## 4. කාර්ය මණ්ඩල විස්තර

### 4.1 ස්ථිර කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | සේවය | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ලේකම් | * | 01 |
| 2. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ 1පංතිය | 01 |
| 3. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ 111 පංතිය | 01 |
| 4. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ 111 පංතිය | 01 |
| 5. | විපක්ෂ නායක ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | - | 01 |
| 6. | පරිපාලන නිලධාරි | රා.ක.ස. අධි පංතිය | 01 |
| 7. | භාෂා පරිවර්තක | භාෂා පරි. සේ 1 පංතිය | 02 |
| 8. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 12 |
| 9. | රියදුරු | රියදුරු සේවය | 10 |
| 10. | කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | 08 |
| එකතුව | | | **38** |

* **අමාත්‍යාංශ ලේකම්වරයෙකු හා සම තත්වයේ තනතුරකි.**

### 4.2 පෞද්ගලික කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | අනුමත මුළුසේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පෞද්ගලික ලේකම් | 01 |
| 2. | සම්බන්ධීකරණ ලේකම් | 02 |
| 3. | මාධ්‍ය ලේකම් | 01 |
| 4. | මහජන සම්බන්ධතා නිලධාරී | 01 |
| 5. | පෞද්ගලික සහකාර | 01 |
| 6. | කළමනාකරණ සහකාර | 13 |
| 7. | පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 02 |
| 8. | නිල නිවාස භාරකරු | 02 |
| 9. | මුරකරු | 01 |
| 10. | අරක්කැමි | 02 |
| 11. | සනීපාරක්ෂක කම්කරු | 01 |
| 12. | කාර්යාල කාර්ය සහායක | 04 |
| 13. | රියදුරු | 07 |
| 14. | ඡායාරූප ශිල්පී | 01 |
| 15. | වීඩියෝ කැමරා ශිල්පී | 01 |
| | **එකතුව** | **40** |

## 4.3 2016 දී සිදු වූ කාර්ය මණ්ඩලය වෙනස්වීම්

### 4.3.1ස්ථිර කාර්ය මණ්ඩලය

#### 4.3.1.1 ස්ථාන මාරු වීම් මත අනුයුක්ත කිරීම්

| අනු අංකය | නම | තනතුර | සේවය | දිනය |
|---|---|---|---|---|
| 1. | එන්. ටී. ඒ. ඩී ඩයස් මහතා | පරිපාලන නිළධාරී | ( රා.ක.ස. අධි පංතිය ) | 2016.02.18 |
| 2. | සී.පී ලොකුගලප්පත්ති මහතා | ගණකාධිකාරී | ( ශ්‍රී.ලං.ග.සේ 111 පංතිය) | 2016.05.09 |
| 3. | ආර්.එල්.ආර් තරංග මහතා | කළමනාකරණ සහකාර | (රා.ක.ස 11) | 2016.05.09 |
| 4. | කේ.එල්.ජී ප්‍රියදර්ශනී මෙනවිය | කළමනාකරණ සහකාර | (රා.ක.ස 111) | 2016.07.07 |

#### 4.3.1.2 නැවත සේවයේ යෙදවීම (කොන්ත්‍රාත් පදනම)

| අනු අංකය | නම | තනතුර | දිනය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| 1. | යු.සී.පී හේරත් මහතා | කළමනාකරණ සහකාර | 2016.08.25 | 2016.12.31 |

#### 4.3.1.3 නව පත් කිරීම් (අනියම්)

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1. | එම්. ඩී.එම් පෙරේරා මෙනවිය | කාර්යාල කාර්ය සහායක | 2016.02.23 |

#### 4.3.1.4 ස්ථාන මාරු වී ගිය කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | සේවය | දිනය |
|---|---|---|---|---|
| 1. | එස්. ඩී හෙට්ටිආරච්චි මහතා | කළමනාකරණ සහකාර | (රා.ක.ස 111) | 2016.06.21 |
| 2. | කේ.බී. මුණිදාස මහතා | කළමනාකරණ සහකාර | (ර.ක.ස 11) | 2016.12.01 |

#### 4.3.1.5 විශ්‍රාම ගිය කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | සේවය | දිනය |
|---|---|---|---|---|
| 1. | ජේ.ඩබ්.සී සෙනෙවිරත්න මහතා | පරිපාලන නිළධාරී | ( රා.ක.ස. අධි පංතිය ) | 2016.01.05 |
| 2. | ඩී. වී. ඒ ජයවර්ධන මහතා | කළමනාකරණ සහකාර | (ර.කා.ස 1) | 2016.04.30 |
| 3. | යු.සී.පී හේරත් මහතා | කළමනාකරණ සහකාර | (ර.කා.ස 1) | 2016.08.25 |

## 4.2 පෞද්ගලික කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | අනුමත මුළුසේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පෞද්ගලික ලේකම් | 01 |
| 2. | සම්බන්ධීකරණ ලේකම් | 02 |
| 3. | මාධ්‍ය ලේකම් | 01 |
| 4. | මහජන සම්බන්ධතා නිලධාරී | 01 |
| 5. | පෞද්ගලික සහකාර | 01 |
| 6. | කළමනාකරණ සහකාර | 13 |
| 7. | පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 02 |
| 8. | නිල නිවාස භාරකරු | 02 |
| 9. | මුරකරු | 01 |
| 10. | අරක්කැමි | 02 |
| 11. | සනීපාරක්ෂක කම්කරු | 01 |
| 12. | කාර්යාල කාර්ය සහායක | 04 |
| 13. | රියදුරු | 07 |
| 14. | ඡායාරූප ශිල්පී | 01 |
| 15. | විඩියෝ කැමරා ශිල්පී | 01 |
| එකතුව | | **40** |

## 4.3.2පෞද්ගලික කාර්ය මණ්ඩලය

### 4.3.2.1පත්කිරීම්- 2016

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| **1.** | එස්. මහේෂ්වරී මිය | අරක්කැමි | 2016.01.01 |
| **2.** | කේ.ඩී.වී. මුණිදාස මහතා | රියදුරු | 2016.03.01 |
| **3.** | එස්.ඩී. රත්නසිංහම් මහතා | ඡායාරූප ශිල්පී | 2016.04.26 |
| **4.** | ආර්. සිවඥානම් මහතා | බංගලා භාරකරු | 2016.09.01 |
| **5.** | ඒ. සිවඥාණමනී මිය | සනීපාරක්ෂක කම්කරු | 2016.09.01 |

## 5. කාර්යය සාධනය

### 5.1 සාමාන්‍ය කාර්යය සාධනය

1. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ගනු ලැබූ තීරණවලට අනුව රැස්වීම් දින 97කට අදාළ පාර්ලිමේන්තු වැඩ සටහන් භාෂාත්‍රයෙන් සකස් කර ඒ පිළිබඳ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ලිපි, ෆැක්ස්, විද්‍යුත් තැපැල, කෙටි පණිවුඩ හා දුරකථන මගින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

2. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් 32ක් සම්බන්ධයෙන් විපක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

3. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් 32ක් සඳහා විපක්ෂ නායකතුමාගේ කාර්යාලය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී වී ඇත.

4. පාර්ලිමේන්තු රැස්වීම් වාර 97ක් සඳහා විපක්‍ෂය වෙනුවෙන් සහභාගීවූ කථිකයන්ගේ නාම ලේඛණය සකස් කිරීම සහ කතා වෙනුවෙන් කාලය වෙන් කර දීමට කටයුතු කර ඇත.

5. ස්ථාවර නියෝග 23/2 යටතේ විපක්‍ෂයේ ගරු පක්ෂ නායකයින් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න 78ක් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කර ඇත.

6. සභාව කල්තැබීමේ අවස්ථාවේ විවාදයන්ට අදාළ විපක්‍ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා 38ක් හා සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න 06ක් මහලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

7. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ගරු අග්‍රමාත්‍යතුමාගෙන් ඇසීමට ඉදිරිපත් කරන ලද ප්‍රශ්න 14ක් පාර්ලිමේන්තු මහලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳ අදාළ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

8. අන්තර් පාර්ලිමේන්තු සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලීයීය පාර්ලිමේන්තු සංගමය හා සාර්ක් පාර්ලිමේන්තු සංගමය සඳහා විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම යෝජනා 33 ක් හා ඉදිරිපත් කිරීමටත් විදේශ සංචාර සඳහා විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නාම යෝජනා 03දෙනෙක් නම් කර යැවීමටත් කටයුතු කර ඇත.

9. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටි අවස්ථාවන්හිදී අවශ්‍ය පසුබිම් වාර්තා, තොරතුරු හා ලේඛන ඔවුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

10. 2017 අයවැය කාරක සභා අවස්ථාවට අදාළ වැඩ සටහන ඇතුළත් පොත භාෂාත්‍රයෙන් සකස් කර එහි පිටපත් 5000ක් මුද්‍රණය කර බෙදා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

11. පහත සඳහන් ආංශික අධික්ෂණ කාරක සභා කමිටු හා අනු කමිටු රැස්වීම් කාල සටහන් පිළිබඳ කෙටි පණිවිඩ හා ඊ මේල් මගින් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කර එම කමිටු සඳහා සම්බන්ධ වී සාකච්ඡා වූ කරුණු වාර්තා ගත කිරීම හා ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටි අවස්ථාවන්හිදී අවශ්‍ය තොරතුරු සපයාදීමට කටයුතු කර ඇත.

| අනු අංකය | ආංශික අධීක්ෂණ කාරක සභාව | පැවැත් වූ රැස්වීම් ගණන |
|---|---|---|
| 1 | ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 5 |
| 2 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශි කඅධීක්ෂණ කාරක සභාව | 10 |
| 3 | ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 13 |
| 4 | තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 11 |
| 5 | කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 8 |
| 6 | අධ්‍යාපනය හා මානව සම්ප ත්සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 15 |
| 7 | සෞඛ්‍ය සහ මානව සුභ සාධනය | 9 |
| 8 | ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 8 |
| 9 | කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 9 |
| 10 | නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 10 |
| 11 | තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 8 |
| 12 | ව්‍යාපාර සහ වානිජ කටයුතු පිළි බඳආංශික අධීක්ෂණ කාරක සභාව | 7 |
| 13 | බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 15 |
| 14 | නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 9 |
| 15 | අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 9 |
| 16 | ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව | 4 |
| එකතුව | | 150 |

12. ව්‍යවස්ථාදායක සභාවට අදාළව ගරු විපක්ෂ නායකතුමා වෙත පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දී ඇත.

13. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 23 දෙනෙකුගේ සන්නිවේදන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යන ලදී.

14. රැස්වීම් වාර 97කදී කාර්යාලයීය නිලධාරීන් පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් සඳහා වෙන් කර ඇති නිල මැදිරියේ රාජකාරි සඳහා යොදවා එමගින්  විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සහායන් ලබා දීමට කටයුතු කර ඇත.

15. එක් එක් රැස්වීම් සතිවලදී විවාදයට ගනු ලබන විෂයන්ට අදාළ සියළුම තොරතුරු (පනත්, කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි, පනත්වලට කරනු ලබන සංශෝධන යනාදිය) ඇතුළත් ලිපි ගොනු සකස් කර ඒවා විපක්ෂයේ පක්ෂ නායකයින්ගේ විමර්ශනය සඳහා පෞද්ගලිකවම බාර දීමට කටයුතු කර ඇත.

16. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්  විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන 178ක් පරිගණක ගත කර දීමට හා අවශ්‍ය ලේඛන භාෂාත්‍රයට පරිවර්තනය කරදීමට කටයුතු කර ඇත.

17. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ විවාද ඇතුළත් සංයුක්ත තැටි ආසන්න 650ක් පමණ පසුගිය වසර තුළදී නිකුත් කිරීමට කටයුතු කර ඇත.

18. අවස්ථා 37 කදී ගරු විපක්ෂ නායකතුමා හමුවීමට පැමිණි රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, දේශීය හා විදේශීය දූත මණ්ඩල සහ අමුත්තන් 195ක් සඳහා හමුවීම් සංවිධානය කර අවශ්‍ය සේවා සැපයීම.

19. ගරු විපක්ෂ නායකතුමාට දේශීය හා විදේශීය ආයතනවලින් සහ පුද්ගලයින්ගෙන්  අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කර ඇත.

20. ගරු විපක්ෂ නායකතුමාට මහජනයාගෙන් ලැබුණු විවිධ දුක්ගැනවිලි පිළිබඳ ලිපි 75ක් සම්බන්ධයෙන් පිළියම් සෙවීමට පියවර ගෙන ඇත.

21. ගරු විපක්ෂ නායකතුමාගේ උපදෙස් පරිදි මාධ්‍ය සාකච්ඡා කැඳවීමට හා පුවත්පත්  නිවේදන නිකුත් කිරීමට අවස්ථා 25කට වඩා වැඩි වාර ගණනකදී කටයුතු කර ඇත.

22. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ හා කොළඹ 07, මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි අංක 30 දරන ස්ථානයේ ඇති විපක්ෂ නායක කාර්යාලයේ සියළුම පරිපාලන හා මූල්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත.

23. විපක්ෂ නායක නිල නිවසෙහි අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය සහාය දීමට කටයුතු කර ඇත.

24. පාර්ලිමේන්තු මහ ලේකම්වරයාටත් ඔහුගේ සමස්ත කාර්යය මණ්ඩලයටත් සිය කටයුතු ඉටුකිරීමේදී මෙම කාර්යාලයෙන් අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කර ඇත.

**සහභාගී වූ පුහුණු වැඩමුළු හා පාඨමාලා**

| අනු අංකය | පුහුණු වැඩමුළුව/ පාඨමාලාව | ආයතනය | සහභාගී වූ නිළධාරීන් | කාලය |
|---|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් | ටී.බී.එම් අතපත්තු මහතා | 2016.01.11-2016.03.24 |
| 02 | පශ්චාත් උපාධි පාඨමාලාව - " Public Management" | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | සී.පී. ලොකුගලප්පත්ති මහතා | 2015-2017 |
| 03 | පශ්චාත් උපාධි පාඨමාලාව - "Conflict and Peace Studies" | ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලය | නලිනි කොහොවල මෙනවිය | 2016-2017 |
| 04 | Microsoft certified Solution Associate Programme | ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලය | බී.ඩී. සතරසිංහ මහතා<br>ඩබ්. එම්.යූ.ඩී කුමාර මහතා | 2016.06.01-2016.12.28 |
| 05 | Personal Grooming Business and Social Etiquette | Skills Development Fund Limited | ස්ථිර කාර්යය මණ්ඩලයේ සියළුම නිළධාරීන් | 2016.07.01 |
| 06 | Advance Function of MS Excel | Distance Learning Central Ltd. | ඩබ්.එම්. යූ.ඩී කුමාර මහතා<br>ආර්. එම්. යූ.පී රත්නායක මහතා | 2016.10.21-2016.10.22 |
| 07 | රියදුරන් සඳහා වූ ධාරිතා පුහුණු වැඩමුළුව | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය<br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>පොලිස් දෙපාර්තමේන්තුව | රියදුරු කාර්ය මණ්ඩලය | 2016.11.08 |
| 08 | සේවක අභිප්‍රේරණය සඳහා වූ වැඩමුළුව | සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යංශය | ස්ථිර කාර්යය මණ්ඩලයේ සියළුම නිළධාරීන් | 2016.12.30 |

**5.2 මූල්‍ය කාර්යය සාධනය**

**2016 වසර සඳහා ප්‍රතිපාදන සහ වියදම් :**

වැය ශීර්ෂය : 19 වැඩසටහන : 01 ව්‍යාපෘතිය : 01

**පුනරාවර්තන :**

| විස්තරය | 2016 සඳහා වෙන්කිරීම් රු. | පරිපූරකවෙන් කිරීම් හා මු.රෙ. 66/69 යටතේ මාරු කිරීම් (+/-) රු. | 2016 සඳහා ශුද්ධ වෙන් කිරීම් රු. | 31.12.2016 දිනට මුළුවියදම රු. | ශුද්ධඉතුරුම් රු. |
|---|---|---|---|---|---|
| **පුද්ගල පඩිනඩි** | **53,000,000** | **-** | **53,000,000** | **36,495,805** | **16,504,195** |
| වැටුප් හා වේතන | 16,500,000 | (490,000) | 16,010,000 | 13,840,339 | 2,169,661 |
| අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් | - | 490,000 | 490,000 | 475,382 | 14,618 |
| වෙනත් දීමනා | 36,500,000 | - | 36,500,000 | 22,180,085 | 14,319,915 |
| **ගමන් වියදම්** | **4,500,000** | **-** | **4,500,000** | **713,395** | **3,786,605** |
| දේශීය | 500,000 | - | 500,000 | 18,196 | 481,805 |
| විදේශීය | 4,000,000 | - | 4,000,000 | 695,199 | 3,304,801 |
| **සැපයීම්** | **9,600,000** | **(394,540)** | **9,205,460** | **6,314,565** | **2,890,895** |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,000,000 | (394,540) | 2,605,460 | 1,601,129 | 1,004,331 |
| ඉන්ධන | 5,600,000 | - | 5,600,000 | 4,335,588 | 1,264,412 |
| ආහාර පාන හා නිල ඇඳුම් | 1,000,000 | - | 1,000,000 | 377,849 | 622,151 |
| **නඩත්තු වියදම්** | **8,000,000** | **-** | **8,000,000** | **4,202,981** | **3,797,019** |
| වාහන | 6,500,000 | - | 6,500,000 | 3,984,962 | 2,515,038 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | - | 500,000 | 159,454 | 340,546 |
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 1,000,000 | - | 1,000,000 | 58,565 | 941,435 |
| **සේවා** | **12,500,000** | **(2,617,490)** | **9,882,510** | **5,373,138** | **4,509,372** |
| ප්‍රවාහන | 500,000 | 950,000 | 1,450,000 | 1,400,910 | 49,090 |
| තැපැල් සහ සන්නිවේදන | 2,500,000 | - | 2,500,000 | 1,149,178 | 1,350,822 |
| විදුලිය සහ ජලය | 2,500,000 | - | 2,500,000 | 624,981 | 1,875,019 |
| බදු කුලි සහ පළාත් පාලන ආයතන බදු | 5,000,000 | (3,606,680) | 1,393,320 | 158,881 | 1,234,439 |
| වෙනත් | 2,000,000 | 39,190 | 2,039,190 | 2,039,188 | 2 |
| **මාරු කිරීම්** | **150,000** | **55,350** | **205,350** | **203,088** | **2,262** |
| රජයේ සේවකයන් සඳහා දේපල ණය පොළි | 150,000 | 55,350 | 205,350 | 203,088 | 2,262 |
| **මුළු පුනරාවර්තන වියදම්** | **87,750,000** | **(2,956,680)** | **84,793,320** | **53,302,972** | **31,490,348** |

මූලධන

| විස්තරය | 2016 සඳහා වෙන්කිරීම් රු. | පරිපූරකවෙන් කිරිම් හා මු.රෙ. 66/69 යටතේ මාරු කිරීම් (+/-) රු. | 2016 සඳහා ශුද්ධ වෙන් කිරීම් රු. | 31.12.2016 දිනට මුළු වියදම රු. | ශුද්ධ ඉතුරුම් රු. |
|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **1,200,000** | **1,271,820** | **2,471,820** | **2,024,502** | **447,318** |
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 500,000 | 121,820 | 621,820 | 621,818 | 2 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000 | - | 400,000 | - | 400,000 |
| වාහන | 300,000 | 1,150,000 | 1,450,000 | 1,402,684 | 47,316 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **900,000** | **45,953,942** | **46,853,942** | **2,584,842** | **44,269,100** |
| වාහන | - | 35,000,000 | 35,000,000 | - | 35,000,000 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 400,000 | 1,681,410 | 2,081,410 | 2,081,407 | 3 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | - | 9,269,082 | 9,269,082 | - | 9,269,082 |
| හැකියා වර්ධන පුහුණු | 500,000 | 3,450 | 503,450 | 503,435 | 15 |
| **මුළු මූලධන වියදම්** | **2,100,000** | **47,225,762** | **49,325,762** | **4,609,344** | **44,716,418** |

**2016 වසර සඳහා වූ පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් පිළිබඳ සාරාංශය**

| විස්තරය | 2016 මුළු ශුද්ධ වෙන්කිරීම් රු. | 2016මුළු වියදම රු. | ශුද්ධ ඉතුරුම් රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | **84,793,320** | **53,302,972** | **31,490,348** |
| මූලධන | **49,325,762** | **4,609,344** | **44,716,418** |
| **එකතුව** | **134,119,082** | **57,912,316** | **76,206,766** |

**2016 වර්ෂයේරජයේ නිළධාරීන්ට අත්තිකාරම් "බී"**

**ගිණුම විෂය අංකය 01901**

| වියදමේ උපරිම සීමාව<br>රු. | ලැබීම්වල අවම සීමාව<br>රු. | හර ශේෂයේ උපරිම සීමාව<br>රු. |
|---|---|---|
| 2,500,000 | 1,200,000 | 7,500,000 |

| අත්තිකාරම් ගිණුමේ නම | ගිණුම් අංකය | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2016.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| | | 2016.01.01 දිනට ආරම්භක ශේෂය රු. | වර්ෂය තුළ හර කිරීම් රු. | වර්ෂය තුළ බැර කිරීම් රු. | 2016.12.31 දිනට අවසාන ශේෂය රු. | |
| රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම | 019011<br>019012 | 4,814,185 | 2,481,996<br>847,834 | 2,210,299<br>403,150 | 5,530,566 | 5,530,566 |

# විපක්ෂ නායකතුමා



ගරු රාජවරෝදයම් සම්පන්දන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | ත්‍රිකුණාමලය |
| සාමාජිකත්වය දරන කාරක සභා | පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව |

# විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා



ගරු අනුර දිසානායක මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ජනතා විමුක්ති පෙරමුණ |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | කොළඹ |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • වරප්‍රසාද පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව |



## ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඊලාම් ජනතා ප්‍රජාතාන්ත්‍රවාදි පක්ෂය |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | යාපනය |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • වරප්‍රසාද පිළිබඳ කාරක සභාව<br>• මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව<br>• තේරීම් කාරක සභාව<br>• ගෘහාස්‍ථ කාරක සභාව<br>• ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• රජයේ මුදල් පිළිබඳ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |

## ගරු විජිත හේරත් මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ජනතා විමුක්ති පෙරමුණ |
| තනතුරු | කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | ගම්පහ |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • උසස් නිලතල පිළිබඳ කාරක සභාව<br>• රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව<br>• පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව<br>• තේරීම් කාරක සභාව<br>• ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නෛතික කටයුතු සහ (විරෝධී දූෂණ) මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |

## ගරු කේ. තුරෙයිරෙත්නසිංහම් මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | ජාතික ලැයිස්තුව |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |



## ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | වන්නි |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |

## ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | වන්නි |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • උසස් නිලතල පිළිබඳ කාරක සභාව<br>• තේරීම් කාරක සභාව<br>• ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නෛතික කටයුතු පිළිබඳ මාධ්‍ය සහ (විරෝධී දූෂණ) සභාව කාරක අධීක්ෂණ ආංශික |



## ගරු මාවෙෙ එස්. සේනාධිරාජා මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | යාපනය |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • උසස් නිලතල පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• තේරීම් කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• රජයේ මුදල් පිළිබඳ කාරක සභාව |

## ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා



| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| තනතුරු | නියෝජ්‍ය කාරක සභාපතිතුමා |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | වන්නි |
| සාමාජිකත්වය දරන කාරක සභා | • ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව<br>• පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව |

## ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමා



| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ජනතා විමුක්ති පෙරමුණ |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | හම්බන්තොට |
| සාමාජිකත්වය දරන කාරක සභා | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• ගෘහ්‍ය කාරක සභාව<br>• තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |

## ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා



| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ජනතා විමුක්ති පෙරමුණ |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | ජාතික ලැයිස්තුව |
| සාමාජිකත්වය දරන කාරක සභා | • පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ව්‍යාපාර සහ වානිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• රජයේ මුදල් පිළිබඳ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |

## ගරු සීනිතම්බි යෝගේස්වරන් මැතිතුමා



| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | මඩකලපුව |
| සාමාජිකත්වය දරන කාරක සභා | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• ගෘහ්‍ය කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ව්‍යාපාර සහ වානිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |



## එස්. ශ්‍රීතරන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | යාපනය |
| සාමාජිකත්වය දරන කාරක සභා | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |



## ගරු ඊ. සරවනපවන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | යාපනය |
| සාමාජිකත්වය දරන කාරක සභා | • වරප්‍රසාද පිළිබඳ කාරක සභාව<br>• ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• සෞඛ්‍ය සහ මානව සුභ සාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• රජයේ මුදල් පිළිබඳ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |



## ගරු එම්. ඒ. සුමන්තිරන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෛයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | යාපනය |
| සාමාජිකත්වය දරන කාරක සභා | • උසස් නිලතල පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව<br>• ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නෛතික කටයුතු ආංශික පිළිබඳ මාධ්‍ය සහ (විරෝධී දූෂණ) සභාව කාරක අධීක්ෂණ<br>• රජයේ මුදල් පිළිබඳ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |



## ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෛයි තමිල් අරසු කච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | දිගාමඩුල්ල |
| සාමාජිකත්වය දරන කාරක සභා | • තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |



## ගරු බිමල් රත්නායක මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ජනතා විමුක්ති පෙරමුණ |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | ජාතික ලැයිස්තුව |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • උසස් නිලතල පිළිබඳ කාරක සභාව<br>• රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |

## ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ජනතා විමුක්ති පෙරමුණ |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | කළුතර |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• තේරීම් කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• සෞඛ්‍ය සහ මානව සුභ සාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |



## ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මැතිතුමා

| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෛයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | වන්නි |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• සෞඛ්‍ය සහ මානව සුභ සාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |

## ගරු එස්. වියාලේන්දිරන් මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෛයි තමිල් අරසු කච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | මඩකලපුව |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව<br>• ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |



## ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මැතිතුමා

| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසුකච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | මඩකලපුව |
| සාමාජිකත්වය දරන කාරක සභා | • පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව<br>• අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව |

## ගරු ශාන්ති ස්කන්දරාසා මහත්මිය



| | |
|---|---|
| දේශපාලන පක්ෂය | ඉලංකෙයි තමිල් අරසුකච්චි |
| මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව | ජාතික ලැයිස්තුව |
| සාමාජිකත්වය දරන කාරක සභා | • මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව<br>• ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |

## ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මැතිතුමා



| | |
|---|---|
| **දේශපාලන පක්ෂය** | ඉලංකෙයි තමිල් අරසුකච්චි |
| **මැතිවරණ දිස්ත්‍රික්කය / ජාතික ලැයිස්තුව** | වන්නි |
| **සාමාජිකත්වය දරන කාරක සභා** | • මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව<br>• සෞඛ්‍ය සහ මානව සුභ සාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව<br>• නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව |